# සාහිත්‍ය කලා රස වින්දනය සඳහා බෞද්ධ ප්‍රවේශයක්

පූජ්‍ය බෝලියද්දේ ධම්මකුසල හිමි[1]

## හැඳින්වීම

රස වින්දනය සෑම සමාජයකම පවත්නා සමාජ විද්‍යාත්මක ලක්ෂණයකි. සාහිත්‍යය ඇතුළු කලාත්මක නිර්මාණ මිනිසාගේ රස වින්දනය උදෙසා මිනිසා විසින් කරන ලද නිර්මාණයන් ය. සාහිත්‍ය කලාවන් සංවේදී ජනතාවක් සිටින කවර සමාජයක වුවද අනිවාර්ය අංගයකි. මිනිස් සමාජය සංවේදී බව වැඩි දියුණු කිරීමෙහි ලා සාහිත්‍ය කලාවන්ගෙන් ලැබෙන අනුබලය අතිමහත් ය. සාහිත්‍ය කලා අධ්‍යයනය හා භාවිතය මගින් පුද්ගලයාගේ රස වින්දනය (Taste) ඔපවත් කර ගත හැකි ය. යම් කලා කෘතියකින් මතුපිටින් ලබන හෝ ලැබෙන සන්තුෂ්ටිය, විනෝදාස්වාදය (Amusement) ලෙස සැලකේ. සාහිත්‍ය කලාවන්ගේ අරමුණ විනෝදාස්වාදය ලැබීමට සීමා වන්නේ නැත. සංවේදීතාවෙන් යුතු සහෘදයා සාහිත්‍යය කෘතියකින් ලබන්නේ රස වින්දනයකි. රස වින්දනය පුද්ගල රුචිකත්වය හා බැඳී පවතී. ඒ අනුව රස වින්දනය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ.

ශ්‍රේෂ්ඨ සමාජ විද්‍යාඥයකු වන බුදුන් වහන්සේ සාහිත්‍ය කලා රස වින්දනයට මිනිසුන් දක්වන රුචිකත්වය මැනවින් අවබෝධ කොටගෙන සිටියහ. යමක් සමාජ විද්‍යාත්මක නම් ඊට විරුද්ධ වීමේ පලක් නැති බව උන්වහන්සේ දැන සිටියහ. බුදු දහම උසස් සාහිත්‍ය කලා රස වින්දනය ප්‍රතික්ෂේප කොට නැත. සූත්‍ර හා විනය පිටකත්ද්වය පරීක්ෂා කිරීමේ දී කලා රස වින්දනය අගය කළ තැන් මෙන් ම පහත් රුචිකත්වයෙන් වෙන්වීම අගය කරමින් කරුණු ඉදිරිපත් කළ තැන් ද අධ්‍යයනය කළ හැකි ය. රස වින්දනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ඔස්සේ සාහිත්‍යකලා රස වින්දනය සඳහා බෞද්ධ ප්‍රවේශයක් පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වෙයි.

## අධ්‍යයන ක්‍රමවේදය

බෞද්ධ ඉගැන්වීම් ඔස්සේ සාහිත්‍ය කලා රස වින්දනය සඳහා නව ප්‍රවේශයක් පිළිබඳ අධ්‍යයනය කෙරෙන මෙම පර්යේෂණයේ දී මූලික වශයෙන් සාහිත්‍ය කලා රස වින්දනය හා ඒ පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් යන අංශ දෙක කෙරෙහි අවධානය යොමු කෙරෙයි. සූත්‍ර පිටකය හා විනය පිටකය මූලාශ්‍ර කර ගනිමින් බුදුන් වහන්සේගේ ඉගැන්වීම් ඔස්සේ කලාත්මක රස වින්දනය පිළිබඳව බෞද්ධ ඉගැන්වීම් පිළිබඳව අධ්‍යයනය කෙරෙයි. සාහිත්‍ය කලා රස වින්දනය

1 ආධුනික කථිකාචාර්ය, භාෂා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය

පිළිබඳ නූතන විද්වතුන් දක්වන අදහස් පිළිබඳව අවධානය යොමු කිරීමේ දී ප්‍රාමාණික විද්වතුන් විසින් පළ කරන ලද ශාස්ත්‍රීය පොත් පත් හා ලිපි ලේඛන ඔස්සේ තොරතුරු අධ්‍යයනය කිරීම මගින් පර්යේෂණය සිදු කරනු ලැබේ.

## අන්තර්ගතය

රසවින්දනය සාහිත්‍ය කලාවේ මූලික අංගයකි. බුදු දහමේ එන ඇතැම් දේශනා පිළිබඳ අධ්‍යයනය කරනවිට සාහිත්‍ය කලා රස වින්දනයට නැඹුරු වීම අනුමත නො කරන බවට තර්ක කළ හැකි ය.

"රුන්නමිදං භික්ඛවේ අරියස්ස විනයේ යදිදං ගීතං උම්මත්තකමිදං භික්ඛවේ අරියස්ස විනයේ යදිදං නච්චං"

"ගීතය ආර්ය විනයෙහි හැඬීමක් බඳුය. නැටීම ආර්ය විනයෙහි උමතු ක්‍රියාවක් බඳුය." බුදු දහමේ එන මෙම දේශනාව රස වින්දනය සඳහා පැන වූ තහනමක් නොවේ. විමුක්ති මාර්ගයේ ගමන් කරන පුද්ගලයාට සුන්දරත්වයෙහි ඇලීම යථාර්ථය දැකීමට බාධාවකි. සුන්දර අසුන්දර සෑම වස්තුවකම යථා ස්වභාවය අනිත්‍යය යැයි බුදු සමය අවධාරණය කරයි. සුන්දරත්වයෙහි යථාර්ථය තේරුම් ගත් තැනැත්තා එය උපාදාන වශයෙන් නොගෙන එයින් ගැඹුරු රස වින්දනයක් ලබයි. මේ අනුව උපාදාන වශයෙන් නොගෙන සෞන්දර්ය වස්තූන් කෙරෙන් ලබන ගැඹුරු රස වින්දනයකට බුදු සමය මග පෙන්වයි.

සාහිත්‍ය කලාවන් නිර්මාණය වන්නේ පුද්ගල රස වින්දනය සඳහා ය. සාහිත්‍යය සම්බන්ධයෙන් නූතනයේ පිළිගත් ප්‍රබල ප්‍රවාදයක් වන්නේ ආනන්දයෙන් ප්‍රඥාව කරා පුද්ගලයා රැගෙන යාම සාහිත්‍යයේ මුඛ්‍ය අභිලාෂය බවයි. බුදු දහමේ ද මූලික අභිප්‍රාය වන්නේ ප්‍රඥාව වර්ධනය යි. පුද්ගලයාගේ ආනන්දය හෙවත් උසස් රස වින්දනය උදෙසා බෞද්ධ ඉගැන්වීම් ඔස්සේ ප්‍රවේශයක් ලබා ගැනීම, පුද්ගලයා සහිත ලෝකය විපරිණාමයට පත් වන බවත් කිසිවක් නිත්‍ය නොවන බවත් ලොව දුක මතම පිහිටි බවත් බුදු සමය අවධාරණය කරන බැවින් ගැටලු සහගත විය හැකි ය. එහෙත් ත්‍රිලක්ෂණය, ප්‍රතීත්‍ය සමුත්පාදය, චතුරාර්ය සත්‍යය, ස්කන්ධ පඤ්චකය යනාදී බුදු දහමේ මූලික ඉගැන්වීම්වලින් දුක පිළිබඳව අවධාරණය කරතත් එපමණකින් ම එයින් සෞන්දර්යාත්මක ඇගයීම් හා සාහිත්‍ය කලා රස වින්දනය බෞද්ධ සමාජය තුළ ප්‍රතික්ෂේප වන්නේ යැයි නිගමනය කිරීම සාවද්‍ය බවින් යුක්ත ය.

බෞද්ධ දර්ශනයෙහි අන්තර්ගත රසය පදනම් කරගත් ඉගැන්වීම් සමුදායේ අවසාන පරමාර්ථය නම් පුද්ගලයා විමුක්ති රසයට යොමු කිරීමයි.

"අප්පකා තෙ සත්තා යෙ අත්ථරසස්ස ධම්ම රස්ස විමුත්ති රසස්ස ලාභිනො. අථකො එතෙව සත්තා බහුතරා යෙ අත්ථරසස්ස

ධම්මරසස්ස විමුක්තිරසස්ස න ලාභිනො තස්මාතිහ භික්ඛවේ එවං සික්ඛිතබ්බං අත්ථරසස්ස ධම්මරසස්ස විමුක්තිරසස්ස ලාභිනො භවිස්සාමාති.''

''අර්ථරසයත්, ධර්මරසයත්යත්, විමුක්ති රසයත් ලබන්නෝ අල්ප වෙති. බහුතරය අර්ථ රසයත් ධර්ම රසයත් විමුක්ති රසයත් නො ලබති. එබැවින් අප ඒ ධර්ම අර්ථ විමුක්ති රසයෝ ලබන්නෝ වෙමු යැයි මහණෙනි නුඹලා හික්මිය යුතු ය.'' මේ අනුව බුදු දහමට අනුව පුද්ගලයා ලබන රස වින්දනය භාව ප්‍රකෝපනයෙන් තොරවිය යුතු ය.

සෞදර්යය පිළිබඳ බුදු සමය ඉදිරිපත් කරන අදහස් අනුව රසිකයා හා රස වින්දනය කෙරෙන සාහිත්‍ය කෘතිය කෙබදු විය යුතු ද? යන්න නිගමනය කළ හැකි ය. සෞන්දර්යය පිළිබඳ බෞද්ධ දර්ශනය කෙබඳු දැයි සංයුත්ත නිකායේ දැක් වේ.

''නතෙ කාමා යානි චිත්‍රානි ලොකෙ
සංකප්පරාගො පුරිසස්ස කාමො
තිට්ඨන්ති චිත්‍රානි තථෙව ලොකෙ
අථෙත්ථ ධීරා විනයන්ති ඡන්දං''

''ලොව පිවිතුරු දෑ කාමයෝ නොවෙති. පුද්ගලයා තුළ පවත්නා කාම සංකල්පනාව රාගය නම් වේ. විසිතුරු දෑ එසේ ම පවතී. නුවණැත්තෝ ඇලීම දුරු කරති.'' මේ අනුව බුදුන් වහන්සේ කාමය තොර සෞන්දර්යාත්මක රස වින්දනය අගය කළ බව පැහැදිලි වේ. සෞන්දර්යය කෙලෙස්වලින් අපවිත්‍ර නොවූවකි. රස වින්දනය සඳහා වූ බෞද්ධ ප්‍රවේශයේ දී සාහිත්‍ය කලා කෘතියට වඩා වැදගත් වන්නේ රසිකයා ය. රසිකයාගේ අධ්‍යාත්මික සංවර්ධනය උසස් සාහිත්‍ය රස වින්දනයක් සඳහා ප්‍රමුඛ සාධකයකි.

**සාකච්ඡාව**

සාහිත්‍ය කලා රස වින්දනය සඳහා අවශ්‍ය ඉගැන්වීම් රාශියක් බෞද්ධ ඉගැන්වීම් තුළ හඳුනාගත හැකි ය. බුදු සමය අවධාරණය කරන රස වින්දනය භාව ප්‍රකෝපණයෙන් තොර විය යුතු ය. විමුක්ති මාර්ගයේ ගමන් කරන පුද්ගලයාට යථාර්ථය දැකීමට රස වින්දනයේ ඇලීම බාධාවක් ලෙස දැක්වුව ද රස වින්දනයට බුදු සමය තහනම් පනවා නැත. උසස් සාහිත්‍ය කලා රස වින්දනයක් සඳහා වඩා වැදගත්ම සාධකය ලෙස බුදු සමය අවධාරණය කරන්නේ පුද්ගල ආධ්‍යාත්මික සංවර්ධනය යි. සුන්දර අසුන්දර වස්තූන්හි යථා ස්වභාවය වටහාගත් පුද්ගලයාට සෑම දෙයක් කෙරෙහිම ප්‍රකෘති මනසකින් බැලිය හැකි ය. එබඳු පුද්ගලයාට සෞන්දර්යාත්මක වස්තූන් පවා උපාදාන වශයෙන් දැඩිව නොගෙන රසවිඳීමට හැකි වේ. උසස් සාහිත්‍ය කලා කෘතියක පවා පවත්නා යථාර්ථය උපාදාන

වශයෙන් නොගෙන පුද්ගලයා ලබන උසස් සාහිත්‍ය කලා රස වින්දනය බුදු සමය අනුව සහිත්‍ය කලා තුළින් ලැබිය හැකි ගැඹුරු රසවින්දනය යි.

**ප්‍රමුඛ පදඃ** බුදුදහම, සාහිත්‍යය, සාහිත්‍ය රසවින්දනය

**ආශ්‍රිත ග්‍රන්ථ**

සුරවීර, ඒ. වී. (1991). *සාහිත්‍ය විචාර ප්‍රදීපිකා.* ප්‍රදීප ප්‍රකාශකයෝ, පිටුව 120.
*අංගුත්තර නිකාය, තිකනිපාත,* (1960). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා. පිටුව 464.
*සංයුත්ත නිකාය,* සලායතන සංයුත්ත, ලෝක සුත්ත, (1981) බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා. පිටුව 118.
*සංයුත්ත නිකාය,* පිහිත සූත්‍රය, (1960) .බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා. පිටුව 76.
*අංගුත්තර නිකාය,* ඒකක නිපාත, (1960). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා. පිටුව 76.
*සංයුත්ත නිකාය,* දේවතා සංයුත්තය, නසන්ති සූත්‍රය, (1960). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා. පිටුව 42.